# මේ වහල් වෙළඳාම නවත්වනු!

1 වෙනි පිටුවෙන් ........

## අහක බලන් සිටින ආණ්ඩු



මැදපෙරදිග රටවලට ශ්‍රීලංකාවෙන් යන ගෘහ සේවිකාවන්ට අත්වන ඛේදජනක ඉරණම ගැන දැන් වසර ගණනාවක් තිස්සේ විවිධ තොරතුරු මාධ්‍යය මගින් හෙළිකර ඇතත් ඒ දුක්ඛදායක තත්වයන් සොයාබලන්නට හෝ ඊට පිළියම් යොදන්නට **1977** දී මේ මැදපෙරදිග ගමන් ඇරඹූ ජේ. ආර්. රජයේ සිට අද ශ්‍රීලංකාවේ පවතින රජය දක්වා මෙතෙක් ආ ගිය කිසිදු රජයක් පියවර නොගැනීම හෙළා දැකිය යුතු කරුණකි. තිරිසන් සතුන්ටවත් නොසල කන අන්දමේ අන්ත නීච විදියට අප රටේ කාන්තාවන්ට සලකද්දී, අතවර කරද්දී ඒ කාන්තාවන් උපයා ගෙනෙන විදේශ විනිමය මත යැපෙන පාලකයින් ඒ කිසිවක් නෑසූ කන් ඇතිව සිටීම තරම් ගුණමකු නිහීන කමක් තවත් ඇතැයි සිතිය නොහැකිය. මේ මැද පෙරදිගට සේවක සේවිකාවන් යවන කොළඹ විදේශ රැකියා හා ප්‍රවර්ධන අමාත්‍යංශය මේ පිළිබඳ විමසීම් කරන මාධ්‍යවේදීන්ට කියන්නේ මෙසේ ය.

" අපේ රටට විශාල විදේශ විනිමයක් ගේන්නෙ ඒ මිනිස්සු... ඒ නිසා ඒ මිනිස්සු එහේදි මූණ දෙන සුළු සුළු ප්‍රශ්න අදින්න එපා...." යනුවෙනි.

අපේ කාන්තාවන්ගේ මුහුණ හා ශරීරයේ බොහෝ තැන් රත්වූ යකඩ වලින් පුළුස්සති. මුහුණ ඉදිමෙන තෙක් පහර දෙති. ගෙදර හාම්පුතා ද ඔහුගේ තරුණ පුතුන්ද ගෘහ සේවිකාව දූෂණය කරති. ශරීරය පුරා යකඩ ඇණ විසි තිස් ගණනක් ගසති. කොළඹට මේවා සුළු දේවල් ය.

## ගෘහ සේවිකාවකගේ තත්වය

අපේ රටේ පවා අද දවසේ නිවසක මෙහෙකාර දැරියකට සලකන අන්දම සිතන කල මැද පෙරදිගට යන අසරණ කාන්තාවන්ට ඒවායේ කෙසේ සලකනු ඇත්දැයි අපට සිතාගත හැකිය. මෙම සේවිකාවන්ට නිශ්චය වශයෙන් නියම කරන ලද කාර්යයක් නැත. ඒ විශාල නිවෙස් හැම තැනම පිරිසිදු කිරීම, ඉවීම පිහීම, රෙදි සේදීම, දරුවන් බලාගැන්ම ආදී නැතක් කටයුතු පාන්දර හයට අවදි වූ වේලාවේ සිට රෑ නමය දහය දක්වා එක දිගට ගෘහමූලිකයා කියන අන්දමට නොපිරි හෙළා කළ යුතු වෙයි. ගෙදර රාමදාන් ආදී උත්සව පවතින කාලයේ වැඩකටයුතු කිව නොහැකි තරම් බහුල වෙයි. එසේම ඒ සියල්ල ඔවුන් පනවන ඉක්මනින්ම කළ යුතුය. ප්‍රමාද වන්නට බැරිය. උණක් හෙම්බිරිසාවක් හැදුණු විට වුවද පැත්තකට වී සිටීමක් නැත. හරියට උදේ හයට ගෘහමූලිකාව සේවිකාව නිදාගන්නා කාමරයේ දොර ළඟට විත් නැගිටපන්.... නැගිටපන්.... යයි අරාබි බසින් කියමින් දොරට පයින් ගසයි. මඳක් වත් පමා නොවී එම ඇනවුමට ඇය වහා එළියට ආයුතු වෙයි. මේ කිසිවකදී නෝනා හා එකට එක කීමක් හෝ නුරුස්නා මුහුණක් හෝ පෙන්නුවොත් එතැන් සිට වැඩවරදී. පහරදීම්, පිළිස්සීම්, ඇණගැසීම් එතැන් සිට ය.

අප රටේ ගෙදරක නෝනා කෙනෙකුට මෙහෙකාරියකට තරමක් අනුකම්පාවෙන් සළකන්නට සිතක් ඇතිවෙන්නට පුළුවන් වුනත්, මේ මැද පෙරදිග අරාබි ගෙවල් වලින් එවැන්නක් කිසිසේත් බලාපොරොත්තු විය හැකි නොවේ. සැබැවින්ම මේ රැකියාවල්ද? සැබැවින්ම මේ ක්‍රියාත්මක වන්නේ පුරාණයේ යුරෝපයේත් අරාබියේත් තිබූ වහල් මෙහෙවර නොවේද?

## ඒජන්සිකාරයෝ

ගෘහසේවිකාවන්ට ඇති ඉල්ලුම දහස් ගණනින් වැඩිවෙත්ම ඒ හා සමාන ප්‍රමාණයක් මැදපෙරදිග රැකියා ලබාදෙන ඒජන්සිද වැඩිවිය. මේ ඒජන්සිකාරයෝ වැඩිදෙනා අමු තක්කඩියෝ වෙති. අරාබියේ තියනවායයි කියන පහසුකම් හා උපයන්නට ලැබෙන ඩිනාම් ඩිනාර් මුදල් සම්භාරය ගැන පිටරට වල් ගැන කිසිත් නොදන්නා, එහෙත් පිටරට යාමට ආසාව ඇති අහිංසක කාන්තාවන්ගේ ඔළුවලට සුන්දර බලාපොරොත්තු ඇතුල් කරන්නේ මේ ඒජන්සි තක්කඩින්ය. කාන්තාවන් විඳින දුක හෝ වැනසෙන ආත්ම ගරුත්වය ගැන හෝ ඒජන්සිකාරයින්ගේ තඹ දොයිතුවක තැකීමක් නැත.



### ලංකාව ඇතුළු ආසියානු රටවල් කීපයක් ම ඒජන්සිකාරයින්ද සමග එකතු වී, සිය දේශයන්හි වැසියන්ගේ ශ්‍රමය සූරාකන්නට ඔවුන් අරාබිකරයට විකුණා මුදල් ඉපයීමෙන් මේ කරන්නේ තනිකරම වහල් වෙළඳාමක් නොවේ ද ?

## වහල් වෙළඳාමේ ආරම්භය

1970 දී තෙල් නිෂ්පාදනය කරන මැදපෙරදිග රටවල් එකතුව පිහිටවූ ඔපෙක් (**O**PEC - **O**rganisation of **P**etroleum **E**xporting **C**ountries) සංවිධානයේ ආරම්භයත් සමග පැට්‍රල් ඩොලර් අරාබි රටවලට ගලා එන්නට පටන්ගත්තේය. මෙය නිසා ඩුබායි, අබුඩාබි, දෝහා, කටාර් ආදී නගරවල මහා පරිමාණ සංවර්ධනය කිරීම ආරම්භ වුණි. ඒ කටයුතු සඳහා වඩුවන්, මේසන්වරුන්, වැල්ඩිංකරුවන්, අත්වැඩකාරයින් ආදී පිරිස් අවශ්‍යවිය. මේ අනුව ප්‍රථමයෙන් පිරිමි මැද පෙරදිගට යෑම ආරම්භ වුණේය. 1970 - 1980 අතර කාලයේ අරාබින්ගේ ජීවන තත්වය උසස්වීමත් සමග අරාබි ගෑණු නෝන ලාගේ තත්වය ගත්හ. උන්ට ගෙදර දොර වැඩට සේවිකාවන් අවශ්‍යවිය. නැනීලා, ආයලා, කුස්සි අම්මලා, අතුපතු ගාන්නන් ආදී ගෘහ සේවිකාවන්ගේ අවශ්‍යතාව මතුවී ඔවුන් ගෙන්වීම ඇරඹුණේ එතැන් සිටය. පැට්‍රල් ඩොලර් නිසා අරාබිකාරයින්ගේ ඔලුව ඉදිමුණු අතර, උන් සිය සේවක සේවිකාවන්ට වහලුන් ලෙස සලකන්නට වූහ.

## ගොදුරුවන කාන්තාවෝ මරණයට කැපවී සිටින රිසානා නෆීක් තරුණිය

මැදපෙරදිගට ගොස් දුක් කරදර හා අතවර වලට මුහුණ පාන බහුතරය ගමේ තරුණියන්ය. වැඩිහිටි කාන්තාවන්ය. ඒ බොහෝ දෙනා විවාහක අයයි. කාලාන්තරයක් තිස්සේ ගම්බද අධ්‍යාපනය නොසලකා හැර තිබෙන අපේ රටේ වැඩිදුර ඉගෙන නොගත් ගම්බද කාන්තාවන්ගේ අනාගතය සුබදායක නොවේ. ඔවුන්ට රැකියා වශයෙන් තෝරාගන්නට ලැබෙන්නේ ලොකු ගෙයක මෙහෙකාරකම හෝ ඇඟලුම් කම්හලක ඇඳුම් මසන කාර්‍යයයි. මැද පෙරදිගට යාමට මං විවරව ඇති බැවින් ඒ වැඩිදෙනෙකු එහි යන්නේ කිසිවක් උපයා ගෙදරට අවශ්‍ය ටෙලිවිෂන් යන්ත්‍රයක් හා නවීන පන්නයේ උපකරණ මිළදී ගැනීමේ ආසාවෙනි. ගේ දොර හොඳට තනාගැනීමේ අදහසිනි.

ඇති යම් ඉඩම් කෑල්ලක් විකුණා හෝ උගසට තබා ඒ මුදල් ඒජන්සි කාරයාට ගෙවා ඔව්හු පිටරට යති. ඒ උපයන මුදල්වලින් කරන්නේ අර ගත් ණය හෝ පොලී ගෙවීමය. සමහර කාන්තාවන්ට ආපසු එන්නට ලැබෙන්නේ සිරුරේ පිළිස්සුම් තුවාල ලප කැලැල් හා පමණක් නොව පොරොන්දුවූ පඩි ද නැතිව ය. ඒ රටවල සිටින ඒජන්තවරුන්ගෙන් හෝ අපේ තානාපති කාර්යාලවලට ඒ දුක් කීමෙන් හෝ වැඩක් නැත. ආපහු ලංකාවට ආ විට පොලී හා උගස් ගෙවාගන්නට විදියක් නැත. ඊළඟට සිදුවන්නේ කබලෙන් ලිපට වැටීමකි.

මැද පෙරදිග රැකියාවන්ට ඔහේ යනවා විනා ඒ කරන්නට යන රැකියාව පිළිබඳ කිසිදු අවබෝධයක් ඔවුන්ට නැත. දරුවන් බලාගන්නට හෝ ගිලනුන්ට සාත්තු කරන්නට හෝ සිදුවන කාන්තාවකට ඒ පිළිබඳ කිසිදු පුහුණුවක් නැත. ඒ නිසාම ඔවුන් අතින් අත්වැරදි සිදුවේ. අරාබියේ දැන් මරණ දඬුවමට මුහුණ පා සිටින රිසානා නෆීක් නම් තරුණිය අතින් එවැනි අත්වැරැද්දක් සිදුවන්නට ඇතියි බොහෝ දෙනාගේ මතයයි. මේවාට වගකිවයුත්තෝ කිසිදු පෙර පුහුණුවක් නැති ගම්බද තරුණ කාන්තාවන් ඒ රටවලට යවන ඒජන්සිකාරයෝ සහ මුලින් කී අමාත්‍යංශයත් මැති ඇමතිවරුද වෙති. මේ කිසිවකදී කාන්තාවන්ගේ සහයට රජය නොඑයි. විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යංශයයි තැනක් වෙන්ව තිබුණත් ඔවුන් බලන හෝ තකන සුබසාධනයක් නැත. "අප රටට බිලියන ප්‍රමාණයෙන් විනිමය උපයා දෙන මේ වීරෝදාර කාන්තාවන් " යයි නිකම් පූච්චන් පට්ටමක් වචනවලින් ගොතා මාසයකට දහස්වාරයක් මැති ඇමතිවරුන් වේදිකා රැස්වීම් ආදියෙහි දී කියතත් ඒවා හිස් වචන පමණකි. කොයි ක්‍රමයකින් හෝ කාන්තාවන් මුදල් රටට ගේනවානම් ඒ ඇත. අවශ්‍ය එපමණය. ඔවුන්ගේ තැකීම ද එපමණ ය.

මේ කාර්‍යයන් භාර ඇමතිවරයාද එම අමාත්‍යංශයේ සේවය කරන නිල ධාරීන්ද මේ සිදුවන අකර තැබ්බ යන්ට සෑහෙන ප්‍රමාණයකට වගකිව යුත්තෝ වෙති. ඔවුන් හරිහැටි සොයා බලා නියම ආකාරයට මේ රැකියා සැපයීම ඔවුන් ගේ බැල්ම යටතේ ක්‍රියාවට නැගුවේ නම් මේ විපත් වළක්වාගන්නට තිබුණි. ඔවුන් සැබැවින්ම ලැජ්ජා විය යුතුය. ඔව්හු දැන් ගොළුවන් බිහිරන් සේ සිටිති.


## පිටරට යාමෙන් වැනසුණු ශ්‍රීලාංකික පවුල් ජීවිත

මැදපෙරදිග රටවලට ගොස් සිටින කාන්තාවන් බොහෝ දෙනා විවාහක අය වෙති. සමහරු විවාහ ගිවිසගත් සැනින් පැමිණි මංගල්‍යයේ කටයුතු කරන අදහසින් පිටරට ගමනට පිවිසෙති. මේ සියල්ලන්ම සැබැවින්ම නොදැන මුහුදු යන්නන්ට සමානය. ඔවුන්ගේ එකම අරමුණ මුදල් හම්බ කරගෙන හැකි ඉක්මනින් නැවත ගෙදර පැමිණීමයි. සිය දරුවන්ගේ හා පවුලේ දියුණුවයි. එහෙත් සියල්ල සිදුවන්නේ ඒ සිතූ ආකාරයෙන් ම ද?

ඇය හම්බකර මුදල් ගෙදර සැමියාට එවයි. සැමියා ඒ මුදල් මත් පැනට, සූදුවට වෛශ්‍යාවන්ට යොදවයි. රැකියාවද නැතිකර ගනී. කමක් නැත. බිරිඳ දිගටම මුදල් එවයි. දරුවෝද මවගේ මුදල් ලැබීම නිසා සෙල්ලක්කාර ජීවිතයට පෙළඹෙති. පියාගේ ඔවුන් ගැන තැකීමක් නැත. බලාකියා ගන්නට, අවවාද කරන්නට මව ගෙදර නැති නිසා දරුවෝ පාසැල් ගමනද කඩාකප්පල් කරගනිති. දියණියෝ බෝයි ප්‍රෙන්ඩ්ස්ලා හා ඇසුරට වැටී ගැබ්ගනිති. ජීවිත නන්නත්තාර කරගනිති.

මැදපෙරදිග ගිය හැම කාන්තාවකගේම පවුලකට මේ ආකාරයෙන් සිදු නොවේ. එහෙත් බොහෝ පවුල් වැටී ඇති තත්වය මෙයයි. මව පිළිස්සුම්, කැලැල්, කැපුම් සහිතව ආපසු එන්නට පුළුවන. එවිට ඇය දකින්නේ තමා පමණක් නොව ගෙදරද, දරු පවුලද විනාස වී ඇති බව ය.

# ශ්‍රීලංකාවට ආදර්ශයක් වන පුටින් සහ රුසියාවේ නව පිබිදීම



Russian Prime Minister Vladimir Putin

**1989 - 90** කාලයේදී එවකට ලෝක බලවතෙකු ලෙස ඇමරිකාව සමග කරට කර සිටි සෝවියට් දේශය ඉතා කෙටි කාලයක දී බිඳ වැටීම නිසා එහි කේන්ද්‍රය සේම ප්‍රධානම රටවූ රුසියාවද අසරණ තත්වයකට වැටිණ. දැනට විසි වසරකට පෙරාතුව සිදු වූ මේ වැටීම රුසියානු ජනතාවට ආර්ථික හා සාමාජීය වශයෙන් තදින් බලපෑ අතර විටෙක අරාජික තත්වයකට පවා පත් විය.

මෙයට හේතු සාධක රාශියකි. ප්‍රධාන වශයෙන් ආර්ථික හා දේශපාලන නායකත්වයේ දුර්වලතා බලපෑ බව කිව හැකි ය. නමුත් ඒ අංශ දෙකෙන්ම **1999 - 2009** පසුගිය දස වසර තුළ සිදුවූ වර්ධනයන් නිසා රුසියාවේ දැන් නව පිබිදීමක් ඇති බව පැහැදිලිය. එම වැටීමට සහ යළි පිබිදීමට හේතුවූ කරුණු විමසා බැලීම මේ ලිපියේ අරමුණයි.

## රුසියානු ආර්ථිකය සහ තෙල් බලය

යුරෝපයෙන් නැගෙණහිර දිසාවට, ආසියා මහාද්වීපය මධ්‍යයේ පිහිටා ඇති විශාලම භූමි ප්‍රමාණයකින් යුක්ත වූ රට රුසියාවයි. සයිබීරියාව වැනි ශීත කාන්තාර වලින් යුතු මේ ප්‍රදේශවල භූගර්භයේ ස්වාභාවික තෙල් සහ ගෑස් ආකාර මහා පරිමාණයෙන් පවතී. මෙයට දකුණෙන් පිහිටි කසකස්ථාන් (Kaza khasthan), උස්බෙකිස්ථාන් ( Uzbekhistan), ටර්ක්මෙරිස්ථාන් (Turkmeristan) ආදී රටවල් රාශියකද මේ තෙල් ඉල්ලම් ඇත. මේ රටවල් සියල්ලම එදා සෝවියට් සමූහාණ්ඩුවට අයත්වූ අතර එය බිඳවැටුණු පසුද රුසියා සමූහාණ්ඩුවට ( Russian Federation) තවමත් සම්බන්ධව පවතින රටවල් වෙති.

ගණන් වල ලෝකයේ ඇතිවූ ඉන්ධන මිළ වැඩිවීම සමග දශක දෙකක් පමණ අන් තෙල් රටවල් සමගම රුසියාවේ ද ආර්ථික ශක්තිය වර්ධනය වීය. එසේම 1980 අග වන විට ලෝක තෙල් මිළ ශීඝ්‍රලෙස බැසීම සමග රුසියාවටද උග්‍ර ආර්ථික අර්බුදයකට මුහුණ දෙන්නට සිදුවිය. මේ වන විට ධනවාදී ලෝකය සමග සීතල යුද්ධයක (cold war) වෙළී සිටි සෝවියට් බලයද පිරිහීමට පත්වන්නට විය. එසේම එවකට සෝවියට් දේශයේ බලයේ සිටි බ්‍රෙෂ්නොෆ් ගර්බාචොෆ් වැනි දුර්වල නායකයන්ට මේ අර්බුදය හසුරුවා ගන්නටද නොහැකිවිය. රුසියාවේ



Putin with his wife Lyudimila

දෙවන ලෝක යුද්ධයෙන් පසු 1990 දක්වා අර්ධ ශතවර්ෂයක් පමණ මෙම ප්‍රදේශවල මෙම ඉන්ධන තෙල් සහ ගෑස් ඉල්ලම් කැණීම තරමකට දියුණු කර ගන්නා ලදී. විමසා බලන විට සෝවියට් දේශයේ ආර්ථික සහ දේශපාලන ශක්තිය සමග මේ තෙල් ශක්තියද පැවතුණ බව පෙනේ.

## හේතුව සහ අහේතුව

මේ අනුව ලෝක තෙල් මිළ වැඩිවීම සමග රුසියාවේ ආර්ථික ශක්තියද දියුණු වෙයි. 1970 දියුණුවට තෙල් මිළ වැඩිවීම හේතුව බවට පත්වෙනවා සේම එය වැටීම රුසියාවේ අහේතුවටද හේතු වූ ප්‍රධානතම කාරණය වෙයි. මෙසේ 1980 අග වන විට සෝවියට් දේශයේ තෙල් ආදායම් වැටීම සමග නාගරික ජනතාවට එදානෙදා අවශ්‍යතාවන් පවා සැපයීමට නොහැකිවිණ. ඒ ප්‍රදේශවල ජනයා කැරළිගැසීමට හා පාලන තන්ත්‍රයට එරෙහිව නැගී සිටීමට සිදුවූයේද මේ පසුබිම තුළය.

මේ අර්බුදකාරී තත්වයන් වෙනස් වන්නට පටන්ගත්තේ 1990